**Press Release**

18 හැවිරිදි එෂාන් මාලිංග පැයට.කි.මී. 141 ක වේගයක් වාර්තා කරමින් එයාර්ටෙල් ශ්‍රී ලංකා ෆාස්ටස්ට් කිරුළ දිනයි

■පැ .කි.මී.141වේගයක් වාර්තා කළ රත්නපුර එෂාන් මාලිංග 19 න් පහළ වේගවත්ම පන්දු යවන්නා සහ ශූරයා ලෙස කිරුළු පළඳියි.

■ නුවර ශයනි සේනාරත්න (ස්ලිංග මාලිංග) පැ .කි.මී.104 වේගයක් වාර්තා කරමින් කාන්තා විවෘත කාණ්ඩය ජයග්‍රහණය කරයි.

■ තංගල්ල මලිඳු ෂෙහාන් 19 න් ඉහළ ශූරතාවය වේගය පැ .කි.මී.140

"එයාර්ටෙල් ශ්‍රී ලංකා ෆාස්ටස්ට් " හෙවත් ශ්‍රී ලංකාවේ අනාගත තරුණ වේගපන්දු යවන්නන් සොයා යාමේ මෙහෙයුම අවසන් කරමින් හොඳම වේගවත්ම පන්දු යවන්නන් තිදෙනා කිරුළු පැලඳවීමට පසුගියදා එයාර්ටෙල් ලංකා ආයතනය ක්‍රියාකළ අතර TV දෙරණ සමග සංවිධානය කළ මෙම තරඟාවලිය තුලින් ශ්‍රී ලංකා වේගපන්දු සංචිතයට නව ශක්තියක් ලැබෙනු ඇති බව විශ්වාස කරයි.

එයාර්ටෙල් ෆාස්ටස්ට් හි සමස්ත ශූරතාව 19 න් පහළ කාණ්ඩය නියෝජනය කළ එෂාන් මාලිංග හිමිකරගත් අතර ,පැ .කි.මී.141ක උපරිම වේගයක් වාර්තා කිරීමට ඔහු සමත් විය.

මීට සමගාමීව 19 න් ඉහළ කාණ්ඩයේ ශූරතාවය මලිඳු ෂෙහාන් හිමි කරගත් අතර ඔහුගේ උපරිම වේගය ලෙස පැ .කි.මී.140 ක් සනිටුහන් විය. ප්‍රේක්ෂකයින්ගේ වඩාත් ආකර්ෂණය යොමු වූ ස්ලිංග මාලිංග ලෙස හැඳින් වූ ශයනි සේනාරත්න කාන්තා විවෘත තරඟයේ ජයග්‍රහණය ලැබීමට සමත් වූ අතර ඇය පැ කි.මී.104 ක වේගයක් වාර්තා කිරීමට සමත් විය.

එයාර්ටෙල් ලංකා හි ප්‍රධාන විධායක නිළධාරී සහ කළමනාකාර අධ්‍යක්ෂ ජිනේෂ් හෙජ් මහතා මේ පිලිබඳ අදහස් දක්වමින්,'එයාර්ටෙල් අපි සැමවිටම තාරුණ්‍යය සවිබල ගැන්වීමට මුල්තැන දෙන ආයතනයක්.තාරුණ්‍යය සමග ජීවත් වෙමින් ඔවුන් සමග වැඩ කරමින් ඔවුන්ගේ ජීවන අභිලාෂයන්ට ගැලපෙන වේදිකාවන් තනා දීමට අප සැමවිටම උත්සාහ ගන්නවා. එයාර්ටෙල් ශ්‍රී ලංකා ෆාස්ටස්ට් තුළින් අප බලාපොරොත්තු වුණේ ක්‍රිකට් ලැදි තරුණ තරුණියන්ට ජාතික තලයට ඒමට අවස්ථාවක් ලබා දීමයි.එහිදී ඔවුන්ට තම ක්‍රිකට් වීරයින්ගේ උපදෙස් සහ පුහුණුව ලබා ගැනීමට හැකි වුණා.

"අපගේ මෙම වැඩසටහනේ සාර්ථක ප්‍රතිඵල දැන් පැහැදිලිවම පෙනෙන්නට පටන්ගෙන තිබෙනවා.තරඟය සඳහා සහභාගි වූ පිරිමි ළමයින්ගෙන් බොහෝ දෙනෙකුට ප්‍රසිද්ධ ක්‍රීඩා සමාජ වලට ඇරයුම් ලබා තිබෙනවා.කාන්තා විවෘත තරඟයේ ඉහලම දක්ෂතා දැක්වූ වූ ගැහැණු ළමයින්ට ද ජාතික සංචිතයට තෝරාගැනීමේ පරීක්ෂණ සඳහා කැඳවීම් ලැබී තිබෙනවා.මෙම තරඟයට සහභාගී වූ සියලුම දෙන පෙන්නුම් කරන ලද කැපී පෙනෙන දක්ෂතා සහ දියුණුවත් ඔවුන්ගේ අධිෂ්ඨානයත් පිලිබඳ එයාර්ටෙල් අපි සැවොම ආඩම්බරයට පත්වෙනවා" යැයි,පවසයි.

මීට අතිරේබව තරඟයේ අනුශූරයින් වූ 19 න් පහළ මොහමඩ් ආකිල් (වේගය පැ.කි.මී.134 ),19 න් ඉහළ කාණ්ඩයේ මොහමඩ් ෆහීම් (වේගය පැ.කි.මී.137) සහ මල්ෂා මධුෂානි (වේගය පැ.කි.මී.101) යන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ටත් අනුග්‍රහය දැක්වීමට ආයතනය කටයුතු කළේය.

TV දෙරණ සමග සංවිධානය කළ එයාර්ටෙල් ශ්‍රී ලංකා ෆාස්ටස්ට් මූලික සුදුසුකම් ලැබීමේ වට සඳහා 10000 කට අධික ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිරිසක් දිස්ත්‍රික්ක 11 ක් නියෝජනය කරමින් සහභගි වූ අතර ශ්‍රී ලංකාවේ පන්දු යැවීමේ හිටපු ජාතික පුහුණුකරු අනුෂ සමරනායක මහතාගේ දැඩි පුහුණුව සහ අධීක්ෂණය යටතේ පළමු වටය සඳහා කාන්තා විවෘත,පිරිමි 19 න් පහළ සහ පිරිමි 19 න් ඉහළ ආදී වශයෙන් කාණ්ඩ 03 යටතේ පන්දු යවන්නන් 145 දෙනකු තෝරාගන්න ලදී.

දෙවන වටය සඳහා එයාර්ටෙල් සුපිරි තරු පුහුණු කණ්ඩායමේ මග පෙන්වීම සහ අධීක්ෂණය යටතේ තවත් 45 දෙනකු තෝරාගත අතර මෙම පුහුණුකරුවන්ගේ සංචිතයට ශ්‍රී ලංකා ජාතික කණ්ඩායමේ පන්දු යැවීමේ පුහුණුකරු අනුෂ සමරනායක ,ශ්‍රී ලංකා ඔ 20 කණ්ඩායමේ නායක සහ ක්‍රිකට් වාර්තා සුනුවිසුනු කළ භයානකම යෝකර් පන්දු යවන්නා ලෙස නම් ලද ලසිත් මාලිංග මෙන්ම ශ්‍රී ලංකා ක්‍රිකට් ඉතිහාසයේ අද්විතීය නාමයන් සටහන් කළ චමින්ද වාස්,හෂාන් තිලකරත්න,සහ උපුල් චන්දන යන ක්‍රීඩකයන් ඇතුලත් විය.

**අවසානයි.**

රූපය 1- කාන්තා විවෘත කාණ්ඩයේ ජයග්‍රාහිකාව ශයනි සේනාරත්න එයාර්ටෙල් සන්නාම උපායමාර්ග හා ආයතනික සන්නිවේදන අංශ ප්‍රධානී චරිත් ද විකේරා මහතා (භාරතී එයාර්ටෙල් ලංකා )වෙතින් ත්‍යාගය ලබා ගනී.

රූපය 2- 19 න් ඉහළ කාණ්ඩයේ ජයග්‍රාහකයා වන මලිඳු ෂෙහාන් එයාර්ටෙල් ප්‍රධාන අළෙවි නිළධාරී චන්ද්‍රසේකර් සිං චෞහාන් මහතා වෙතින් ත්‍යාගය ලබා ගනී

රූපය 3- එයාර්ටෙල් ෆාස්ටස්ට් ජයග්‍රාහකයා වන එෂාන් මාලිංග , භාරතී එයාර්ටෙල් ලංකා හි රධාන විධායක නිළධාරී සහ කළමනාකාර අධ්‍යක්ෂ ජිනේෂ් හෙජ් සහ ලසිත් මාලිංග සමග

රූපය 4- ජයග්‍රාහකයින් තිදෙනා භාරතී එයාර්ටෙල් ලංකා TV නිළධාරීන් සමග

භාරති එයාර්ටෙල් ලංකා පිලිබඳව

වර්ෂ 2009 ජනවාරි 12 වන දින ශ්‍රී ලංකාවේ මෙහයුම් ඇරඹූ භාරති එයාර්ටෙල් (එයාර්ටෙල් ලංකා ) පාරිභෝගිකයන් මිලියනයක් කරා ලඟා වී සිටින ශ්‍රී ලංකාවේ වේගවත්ම සන්නිවේදන ජාලය වේ.තම වාණිජ මෙහයුම් ඇරඹූ 2009 වර්ෂයේ සිට වසර 03 ක් වැනි කෙටි කාලයක් තුළ එයාර්ටෙල් ලංකාවේ සෑම ප්‍රදේශයක් කරාම ව්‍යාපත් වූ අතර අද වන විට මුළු දිවයිනම ආවරණය කරනු ලබයි.ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි කර ඇති එයාර්ටෙල් ලංකා දුරකථන අන්තර්ජාල

සේවාවන් සහ ආයතනික විසඳුම් ඇතුළු  ඩිජිටල් ජංගම දුරකථන සේවාවන් රාශියක් පිරිනමයි.වැඩි විස්තර සඳහා " www.airtel.lk” වෙත පිවිසෙන්න.